# 8 ශ්‍රේණිය ඉතිහාසය

## 01. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව

### A කොටස

01. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ක්‍රිස්තු පූර්ව හය වන ශතවර්ෂයේ දී මෙරට ජනාවාස ව්‍යාප්තියේ ශීඝ්‍ර වර්ධනයක් සිදු වීමට හේතු වූයේ,
(i) ඉන්දියාවෙන් පිරිස් පැමිණීම නිසා ය.
(ii) දීර්ඝ කාලයක් අයහපත් කාලගුණයක් පැවතීම නිසා ය.
(iii) බුද්ධිමත් පාලකයෙකු යටතේ ගම් ආශ්‍රිත පාලනයක් සිදු වීම නිසා ය.
(iv) ද්‍රව්‍ය හුවමාරුව වෙනුවට මුදල් හුවමාරුව සිදු වීම නිසා ය.

(2) අතීතයේ වියළි කලාපයේ වගා කටයුතු සඳහා යොදා ගැනීමේ දී ජනයා මුහුණ දුන් අභියෝගයක් වන්නේ,
(i) ජලයේ විවිධ ලවණ වර්ග දිය වී තිබීම නිසා වගාවට නුසුදුසු වීම.
(ii) ජනතාව තුළ සාමූහිකත්වය නොතිබීම.
(iii) අතිරික්ත ජලය ඉවත් කර ගැනීමට සිදු වීම.
(iv) අවශ්‍ය ජලය රැස් කර තබා ගැනීමට සිදු වීම.

(3) පණ්ඩුකාභය රජුගේ කාලයේ දී ඉදි කළ වැව් තුනක් වන්නේ,
(i) ජය වාපි, මයෙත් වාපි, බානු වාපි.
(ii) ජය වාපි, අභය වාපි, ගාමිණී වාපි.
(iii) ජල්ලුර වාපි, ගාමිණී වාපි, පාදුලක වාපි.
(iv) අභය වාපි, ගාමිණී වාපි, ජල්ලුර වාපි.

(4) මානන්කට්ටිය වැව ඉදි කරවන ලද රජතුමා වන්නේ,
(i) ධාතුසේන රජතුමා ය.
(ii) මහසෙන් රජතුමා ය.
(iii) වසභ රජතුමා ය.
(iv) පළමුවන අග්ගබෝධි රජතුමා ය.

(5) මින්නේරිය දෙවියන් ලෙස ජනතාව අතර ප්‍රසිද්ධ වූ රජතුමා වන්නේ,
(i) වසභ රජතුමා.
(ii) මහසෙන් රජතුමා.
(iii) පළමු වන පරාක්‍රමබාහු රජතුමා.
(iv) ධාතුසේන රජතුමා.

(6) ධාතුසේන රජතුමා තැන වූ වැව් දෙකක් අතීතයේ හැඳින් වූ නාමයන් වන්නේ,
(i) පාදුලක වාපි හා මහාදත්ත වාපි.
(ii) ජල්ලුර වාපි හා බානු වාපි.
(iii) පාදුලක වාපි හා ජල්ලුර වාපි.
(iv) මහාදත්ත වාපි හා බානු වාපි.

(7) පළමු වන පරාක්‍රමබාහු රජතුමා විසින් "මදකුත් ලෝකෝපකාරයෙන් තොර ව මුහුදට නොයේවා" යනු සංරක්ෂණය කළ යුතු බව ප්‍රකාශ කළේ,
(i) ගංගාවලින් ලැබෙන ජලයයි.
(ii) වැව්වල ගබඩා කළ ජලයයි.
(iii) වැස්සෙන් ලැබෙන ජලයයි.
(iv) පන්සල්වල පොකුණුවලින් ලබා ගන්නා ජලය

මහ වැවක් පිළිබඳ **සත්‍ය** ප්‍රකාශය වන්නේ,
(i) අවම වශයෙන් අඩි 20ක් හා අඩි 30ක් අතර උසක් ඇත.
(ii) අවම වශයෙන් අඩි 20ක් හා අඩි 30ක් අතර දිගක් ඇත.
(iii) වැවේ උස අඩු වන විට රැඳෙන ජල ප්‍රමාණය වැඩි ය.
(iv) වැවේ උස වැඩි වන විට බැම්ම මත යෙදෙන ජල පීඩනය අඩු ය.

අතීතයේ දී වැව් බැම්මක් සෑකසීමේ දී සිහිදී ...

LIVEWORKSHEETS